# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/56 - 2018 සැප්තැම්බර් මස 22 වැනි සෙනසුරාදා - 2018.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ෆයිසර් මුස්තාෆා,
ජනාධිපති නීතිඥ,
පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග සහ 2017 පෙබරවාරි මස 13 වැනි දින අංක 2006/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (සංශෝධිත) ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. 2016.10.27 දිනැති හා අංක 1990/23 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල නියෝග අංක 2(4) නියෝගයට පසුව පහත දැක්වෙන නියෝග ඇතුළත් කිරීම.

2.4 (අ) ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතක් ලැබුණු විටෙක, ඉහත කී ශාස්ත්‍ර ගෙවීමෙන් පසු පහත දැක්වෙන නිර්ණායක පදනම් කරගෙන එකී සංගමය වර්ගීකරණය කිරීමෙන් අනතුරුව 2016.10.27 දිනැති හා අංක 1990/23 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල 2(5) නියෝගය අනුව එම සංගමය ලියාපදිංචි කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රීඩා අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(i) 'අ' ශ්‍රේණිය - සාමාජිකයින්/ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන 25 ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් හෝ ඊට වැඩි

(ii) 'ආ' ශ්‍රේණිය - සාමාජිකයින්/ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන 15 ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන 10 ක් හෝ ඊට වැඩි එහෙත් රු. මිලියන 50 ට අඩු

(iii) 'ඇ' ශ්‍රේණිය - සාමාජිකයින්/ක්‍රීඩා සමාජ/අනුබද්ධ ආයතන ඕනෑම සංඛ්‍යාවක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන් 10 ට අඩු

එසේ වී නමුත්, ජාත්‍යන්තර තරගයක දී කිසියම් තනි පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක පරිසාධනය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් එකී ක්‍රීඩාවට අදාළ ජාතික සංගමය අදාළ පරිද්දෙන් 'අ' ශ්‍රේණිය හෝ 'ආ' ශ්‍රේණියට උසස් කරනු ලැබිය හැකිය.

(ආ) මෙම නියෝගය රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලබන දිනයේ සිට සති තුනක් ඇතුළත ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්, අමාත්‍යවරයාගේ අදහස් විමසා, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දනටමත් ලියාපදිංචි වී ඇති සියළු ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ තක්සේරු/ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය කිරීම සඳහා සාමාජිකයින් 05 දෙනෙකුට නොවැඩි කමිටුවක් පත්කළ යුතු වේ. ඉහත කී කමිටුව විසින් ලියාපදිංචි වී ඇති සංගම් වර්ගීකරණය පිළිබඳ කටයුතු නිම කොට එම නිර්දේශ එකී වර්ගීකරණය පිළිබඳව සමාලෝචනය කරනු වස් ලිපිලේඛන තමන්ට යොමුකළ දින සිට සතියක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතු ය.

2. 2017.02.13 හා අංක 2006/13 දරන (සංශෝධිත) ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල නියෝග අංක 07 (xiv) (ආ) ඡේදය ඉවත් කොට පහත දක්වෙන නව ඡේදය ඇතුළත් කරනු ලැබේ. විශේෂ මහ සභා රැස්වීමක් හෝ අති විශේෂ මහ සභා රැස්වීමක් පවත්වා පහත දක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත, තිදෙනෙකුගෙන් යුත් නිලවරණ කමිටුවක් පත්කිරීම කළ යුතු ය.

i. විශ්‍රාමලත් මහාධිකරණ සහ/හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු සහ/ එකී A ශ්‍රේණියේ සංගමය තුළ ක්‍රියාකාරී සාමාජිකයෙක් නොවන මැතිවරණ දෙපාර්තමේන්තුවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් /හෝ නිලවරණ පැවැත්වීම පිළිබඳ පළපුරුදු සුදුසුකම් ඇති විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරියෙක්.

ii. විශ්‍රාමලත් මහාධිකරණ සහ/හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු සහ B ශ්‍රේණියේ සංගමය තුළ ක්‍රියාකාරී සාමාජිකයන් නොවන මැතිවරණ දෙපාර්තමේන්තුවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්/සාමාජිකයින් දෙදෙනෙකු හෝ විශ්‍රාමලත් ඕනෑම ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් දෙදෙනෙකු

iii. 'අ' ශ්‍රේණියේ සංගමයක් සම්බන්ධයෙන් ගත්කළ උක්ත සංගමයක ක්‍රියාකාරී සාමාජිකයන් නොවන්නා වූ ද, නිලවරණ පැවැත්වීම පිළිබඳ පළපුරුද්දක් ඇති විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක්

3. 2017.02.13 හා අංක 2006/13 දරන (සංශෝධිත) ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල නියෝග අංක 7 (xiv) (ඇ) නියෝගයට ඉක්බිතිව පහත දක්වෙන නව නියෝග ඇතුළත් කිරීම.

(ඈ) ඉහත දක්වා ඇති පරිදි නිලවරණ කමිටුව පත්කිරීමෙන් අනතුරුව, එහි පත්වීම් දින සිට මාස දෙකකට නොඅඩු කාලයක් තුළ නිලවරණ කමිටුව නාම යෝජනා කැඳවිය යුතු ය.

(ඉ) ක්‍රීඩා පනත අනුව නිලධාරීන් වශයෙන් තෝරා පත්කරනු ලැබීමට සුදුසුකම් ලබන අපේක්ෂකයන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ අධිකාරී බලය නිලවරණ කමිටුවට තිබිය යුතු ය. එක් එක් ජාතික ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාව සහ අදාළ නියෝගවලට අනුව එය සිදුකළ යුතු ය.

(ඊ) ඡන්දය පැවැත්වීමේ ක්‍රියාවලිය උදෙසා ඡන්දදායක නාම ලේඛනයේ සුදුසුකම් සම්බන්ධයෙන් නිර්ණායක සම්පාදනය කිරීමේ බලය සහ නිලධාරීන් තෝරා ගැනීම සඳහා ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් ඡන්ද නාම ලේඛනය පරීක්ෂා කිරීමට, නාම යෝජනා කැඳවීමට හා නිලවරණ කටයුතු සම්පූර්ණ කිරීමට නිලවරණ කමිටුවට බලය තිබිය යුතු ය.

(උ) 7 (xiv) (ඇ) නියෝගය ප්‍රකාරව යථෝක්ත කමිටුව පත්කළ දින සිට දින 14 ක් ඇතුළත නිලවරණ කමිටුව විසින් ඡන්ද දායක නාමලේඛනය පිළිබඳ කටයුතු නිමකොට ජාතික ක්‍රීඩා සංගමයේ සියළු සාමාජිකයන්ට දැන්විය යුතු ය. 'නිලවරණ' පැවැත්වීමට යටත් පිරිසෙයින් දින 21 ට පෙරාතුව නිලධාරීන් වශයෙන් තෝරාපත් කරනු ලැබීමට සුදුසු නිලධාරීන්ගේ නාම ලේඛණය පිළිබඳ කටයුතු නිලවරණ කමිටුව විසින් නිමකළ යුතු ය.'

(ඌ) නිලවරණ කමිටුවේ තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන ඕනෑම පුද්ගලයෙකු විසින් 8(1) නියෝගය ප්‍රකාරව එකී තීරණය දැනුම් දුන් දින සිට දින 7 ක් ඇතුළත ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා වෙත ඊට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

4. 2016.10.27 දිනැති හා අංක 1990/23 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග අංක 8 ඉවත් කොට පහත දක්වෙන නියෝග ආදේශ කිරීම මගින් ;

8 (1) ලියාපදිංචි කරනු ලැබූ ජාතික ක්‍රීඩා සංගමයක් හෝ ජාතික ක්‍රීඩා සංගමයක නිලවරණ කමිටුවක් විසින් දෙනු ලැබූ තීරණයක් හෝ ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් අගතියට පත්වන ඕනෑම පාර්ශවයක් විසින් එකී තීරණය හෝ ක්‍රියාමාර්ගය දැනුම් දුන් දින සිට දින 07 ක් ඇතුළත ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

8 (2) A ශ්‍රේණියේ හෝ B ශ්‍රේණියේ සංගමයක් සම්බන්ධයෙන් ගත්කළ එසේ ලැබුණු අභියාචනයක් අමාත්‍යවරයා විසින් සලකා බැලීමෙන් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු ප්‍රමුඛ තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයකට ඉදිරිපත් කළ යුතු අතර, C ශ්‍රේණියේ සංගමයක් සම්බන්ධයෙන් ගත්කළ, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත ආදේශක මණ්ඩලයකට යොමු කරනු ලැබිය හැකිය. එක් එක් කමිටුව විසින් සමාලෝචනය පිණිස ලද එකී අභියාචනා පිළිබඳ තීරණ තමන් වෙත අභියාචනා ලැබුණු දින සිට දින 7 ක් ඇතුළත ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු ය.

8 (3) ඉනික්බිතිව, ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා, වැඩකරන දින 7 ක් තුළ තම තීරණය අදාළ ක්‍රීඩා සංගමය වෙත දැනුම් දිය යුතු අතර, එය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.